# දෙමළ අපේක්ෂා

මෙරට දෙමළ ප්‍රශ්නය විසඳීම මෙතරම් කල්ගත වී ඇත්තේ ප්‍රශ්නය ඇතිකළවුන් ම ඒ විසඳීම සඳහා ඊනියා උපකාරකිරීමට ඉදිරිපත් වී ඇති බැවිනි. දෙමළ ප්‍රශ්නය මූලිකව ම ඇති කළෝ ලන්දේසීහු හා ඉංගිරිසිහු ය. ඒ පිළිබඳ අප බොහෝ විට ලියා ඇති බැවින් නැවතත් සඳහන්කිරීම අනවශ්‍ය ය. ඔවුන්ට අමතර ව විශ්වවිද්‍යාලවල හා රාජ්‍ය නොවන ආයතනවල සේවයකරන ඔවුන්ගේ ගෝල බාලයෝ තම ස්වාමිවරුන්ගේ ඊනියා ප්‍රවාද යොදාගනිමින් ඊනියා ප්‍රශ්නය විසඳීමට සහාය පළකරති. රාජ්‍ය නොවන ආයතන යනුවෙන් අද හැඳින්වෙන්නේ කුළගන සමිති, මරණාධාර සමිති, දායක සභා ආදිය නොව බටහිරයන් විසින් නඩත්තු කෙරෙන බටහිරයන් විසින් මෙහෙයවෙන සමිති සමාගම් ය.

රාජ්‍ය නොවන සංවිධාන යනු බටහිර යටත්විජිතවාදයේ නවතම ඒජන්ත ආයතන වෙයි. බටහිර යටත්විජිතවාදය හෝ බටහිර නූතනත්වය හෝ අවසන් වූයේ නැත. ඒ දිගින් දිගටම සියවස් පහක් තිස්සේ ගලා යයි. අප මෙහෙය වූ සුද්දු ඒජන්තයන් ආපසු ගොස් දශක කිහිපයක් ඇවෑමෙන් බටහිරයෝ රාජ්‍ය නොවන ආයතන මගින් නව කළු ඒජන්තයන් පත්කළහ. ඔවුන් පත්කර ඇත්තේ සුද්දන්ගේ මතවාදය ආරක්ෂාකිරීමට හා තහවුරුකිරීමට ය. මෙහි දී යහපත් රාජ්‍ය නොවන සංවිධාන නමින් ආයතන නැත. බටහිරයන් ඊනියා යහපත් රාජ්‍ය නොවන සංවිධාන පවත්වාගෙන යන්නේ ම ඔවුන්ට සුපුරුදු ආකාරයට ඊනියා මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව පෙන්වීමට ය. මේ ඊනියා යහපත් ආයතනවලින් ජනතාවට කල්පවතින සුභ සාධනයක් හෝ සිදු නො කෙරෙයි. එමගින් කෙරෙන්නේ එක් පැත්තකින් රාජ්‍ය නොවන සංවිධාන ගැන විශ්වාසයක් ඇති කිරීම ය. අනෙක් පැත්තෙන් බැටළුහම් පොරවාගත් ඇතැම්හු භික්ෂූන් වහන්සේට වරුද්ධව ,අතන මෙතන කසුකුසු ගාති. එමගින් භික්ෂූන් වහන්සේ ගැන ජනතාවට වැරදි චිත්‍රයක් මවාදීමට උත්සාහ කරති.

බටහිර ඊනියා සමාජ විද්‍යාඥයන්ට අනුව ජාතිය යනුවෙන් යමක් නො පවතියි. එහෙත් ඔවුහු ජාතිය ගැන කතාකරති. ඔවුහු යමකු සිංහලවන්නේ කෙසේ ද යන බහුබූත ප්‍රශ්නය අසති. යමකුගේ ජාතිය තීරණයකරන නිර්ණායක කවරේදැයි අසති. ආනමාළු කෙසෙල් ගෙඩියක් ඇඹුල් කෙසෙල් ගෙඩියකින් වෙන්කර හඳුනාගන්නේ කෙසේදැයි බටහිර උද්භිද විද්‍යාඥයෝ දනිති. එහෙත් බටහිර සමාජ විද්‍යාඥයෝ සිංහලයකු ඉංගිරිසිකාරයකුගෙන් වෙන්කරගන්නේ කෙසේ දැයි නො දනිති. එවැනි සමාජ විද්‍යාවක් ගැන කිවහැක්කේ කුමක් ද? සිංහලයකු වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව මහා දාර්ශනික සාකච්ඡාවක් පේරාදෙණියෙන් බිහි වූ දීප්තිමත් පඬිවරුන් යැයි කියැවෙන නිව්ටන් ගුණසිංහ හා චාල්ස් අබේසේකර මහත්වරුන් අතර සිදුවිණි යැයි තවත් එවැනි ම දීප්තිමත් විද්වතකු යැයි කියැවෙන මයිකල් රොබට්ස් මහතා සඳහන්කර ඇත. මෙහි ඇත්තේ ගැඹුරු දර්ශනයක් නොව බටහිර සමාජ විද්‍යාවෙහි බංකොළොත් බව ය. බටහිර භෞතික විද්‍යාව පසුපස නොන්ඩි ගසන බටහිර සමාජ විද්‍යාව ජාතිය, සංස්කෘතිය ආදිය නිර්ණයනය කිරීම සඳහා ඊනියා වාස්තවික නිර්ණායක සොයයි. ඔවුන්ට හමුවන එකම ඊනියා වාස්තවික නිර්ණායකය ජාතික රාජ්‍යයක පුරවැසියකු වීම ය. රටක පුරවැසියන් කවුරුදැයි ඒ රටේ යම් කාර්යාලයකින් දැනගත හැකි ය. ඊනියා සමාජ විද්‍යාඥයන් දන්නා වාස්තවික නිර්ණායකය මේ කාර්යාල සහතික ය (කොල කෑල්ල ය). එමගින් පුද්ගලයකුගේ ජාතිය කුමක් දැයි තීරණය කළ ද සංස්කෘතිය කුමක් දැයි තීරණය කළ නො හැකි ය. අනේ මෙහෙම සමාජ විද්‍යාවක්! කෙහෙල් ගෙඩි වර්ගීකරණය කිරීමට අසමත් උද්භිද විද්‍යාවක් වේ නම් ඒ කුමකට ද? පුද්ගලයකුගේ ජාතිය සංස්කෘතිය හඳුනාගත නොහැකි සමාජ විද්‍යාවක් මොන කෙහෙල් මලකට ද? ඊනියා වාස්තවිකත්වයක් ගැන විශ්වාසකරන ක්වොන්ටම් භෞතිකයටත් පැවැත්ම හා න්‍යාය පිළිබඳ ප්‍රශ්න ඇති කල සමාජ විද්‍යාඥයන්ගේ වාස්තවිකත්වය ගැන කියනුම කවරේ ද? ලංකාවේ ක්වොන්ටම් භෞතිකය ගැන කතාකරන කසිකබල් මාක්ස්වාදීන්ට හෝ පශ්චාත්නූතනවාදීන්ට හෝ හිල්බට් අවකාශය යන්න ඊනියා මාධ්‍ය අවකාශයෙන් වෙන්කර ගැනීමට නො හැකි ය.

බටහිර සමාජ විද්‍යාඥයන් හා ඔවුන්ගේ ලංකාවේ සිටින ගෝල බාලයන් දාර්ශනික සාකච්ඡා යැයි කියන විහිළු තහළු කෙසේ වෙතත් මේ රටේ දෙමළ නමින් ජනවර්ගයක් වෙයි. ඇතැම් විට මේ සමාජ විද්‍යාඥයන් කසිකබල් මාක්ස්වාදය පසුපස ගොස් ජාතිය පිළිබඳ විඥානය ව්‍යාජ විඥානයක් යැයි කීමට ඉඩ ඇත. එසේත් නැතහොත් අල්තුසර්ගේ සංකල්පයක් අනුව ජාතිය අධිනිශ්චය වී (ඕවර්ඩිටර්මින්ඩ්) ඇතැයි කියනු ඇත. ඔවුන්ට අනුව පංති විඥානය යථාර්ථවාදී ය. අපට නම් සෑම විඥානයක් ම සෑම සංකල්පයක් ම බොරුවකි. එහෙත් සම්මුති වශයෙන් පවත්නා යම්

© Prof. Nalin De Silva

යම් දෑ වෙයි. ජාතිය ද එවැනි සම්මුතියකි. එහෙත් පංතිය යන්න සම්මුතියක්වත් නො වේ. රතු කමිස හැඳගත් නීතිඥයන් වෛද්‍යවරුන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් කිහිප දෙනකු කිසිම හැඟීමක් නොමැතිව කම්කරු පංතියක් ගැන කතාකළ ද කම්කරුවෝ තමන් කම්කරු පංතියකට අයත්වීමක් ගැන සිහිනෙන්වත් නො සිතති. එහෙත් ඒ කම්කරුවෝ තමන් සිංහල ජාතියට අයත් ය යන විඥානයෙන් පසුවෙති. අනෙක් අතර අධිනිශ්චය යන්නෙන් ද කියැවෙන්නේ බටහිර සමාජ විද්‍යාවෙහි බංකොළොත් බව ය. බටහිර භෞතික විද්‍යාඥයකු කිසි දිනෙක විද්‍යුත් චුම්බක ක්ෂෙත්‍රය ගුරුත්වාකර්ෂණ ක්ෂෙත්‍රයට සාපේක්ෂව හෝ නැතිව හෝ අධිනිශ්චය වී ඇතැයි නොකියනු ඇත. එපමණක් නො වෙයි. ඕවර්ඩිටර්මින්ඩ් යන්න අධිනිශ්චය ලෙස පරිවර්තනයකිරීම ද වැරදි ය. එයින් පෙන්නුම්කරන්නේ සිංහලෙන් මේ කසිකබල් සංකල්ප ගැන ලියන්නවුන්ගේ ඉංගිරිසි දැනුමෙහි, සිංහල දැනුමෙහි හා විෂය දැනුමෙහි අඩුව මිස අනෙකක් නො වෙයි. අද ලංකාවේ ව්‍යාජ උගතුන් අධිනිශ්චය යන්න අධිවිනිශ්චය යන අරුතින් ද යොදාගැනීමෙන් පටලැවීම තවත් වැඩි වී ඇත. දෙමළ ජනවර්ගයක් නැතැයි කියන මේ බහුබූතයන් නොදන්නා දෙමළුට ගොස් වරිගෙ නසාගෙන ඇත.

ලංකාවේ දෙමළ ජනවර්ගයක් වෙයි. මේ ජනවර්ගයෙට අපේක්ෂා තිබී ඇත. දැනටත් අපේක්ෂා වෙයි. එහෙත් ඔවුන්ට දෙමළ වීම නිසා ම පමණක් වූ ප්‍රශ්නයක් නැත. ඇතැයි කියන ප්‍රශ්නවලට දෙන විසඳුම්වලින් පසුවත් දෙමළ ප්‍රශ්නය නොවිසඳීමෙන් පෙන්නුම් කෙරෙන්නේ එවැනි ප්‍රශ්නයක් නැති බව ය. බොරුවට නිදාගෙන සිටින්නකු අවදිකිරීමට නො හැකි ය. දෙමළ ජනයාගේ අපේක්ෂාවල විකාශයක් වෙයි. පළමු අපේක්ෂාව වූයේ දෙමළ ජනයාගේ නායක පවුල් කිහිපයකට ය. කුමාරස්වාමි - පොන්නම්බලම් පවුල ප්‍රධාන කොටගත් මේ පවුල්වලට තිබුණේ එවැනි සිංහල පවුල් කිහිපයක් අභිබවා ලංකාවේ ම නායකත්වයට පත්වීමේ අපේක්ෂාව ය. මේ අපේක්ෂාව අවුරුදු දෙසීයක් පමණ පැරණි ය. එය අඩුම තරමින් ව්‍යවස්ථාදායක මණ්ඩලයට නිල නොලත් මන්ත්‍රීන් පත්කරගත් දිනය දක්වා දිව යයි. 1947 දී පළමු පාර්ලිමේන්තුව පත්කරගන්නා තුරුම මේ අපේක්ෂාව විය. එහෙත් එයට පළමුව ද සීමිත ඡන්ද බලයක් ලැබුණු 1912න් පසුව මේ අපේක්ෂාව හීනවීමට පටන්ගෙන තිබුණි. 1931 දී ලැබුණු සර්වජන ඡන්දයත් සමග ඒ තවත් හීනවිමට විය. දෙමළ ජනයාට වූ ඊනියා අසාධාරණ ලෙස කළ එළි බැස්සේ මේ අපේක්ෂාව ඉටුකර ගැනීමට නො හැකි වීම ය.

මුළු ලංකාවේ ම නායකත්වයට දෙමළ නායකයන් පත්කරගැනීම පිළිබඳ අපේක්ෂාව බ්‍රිතානි ආණ්ඩුකාරයන් විසින් ඇතිකර පෝෂණය කරන ලද්දකි. බ්‍රිතානීන් ඇතුළු බටහිරයන්ගේ අපේක්ෂාව බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හැරෙන්නට අනෙක් සංස්කෘතීන් හැකිනම් ලෝකයෙන් අතුගා දැමීම ය. බැරිනම් අනෙක් සංස්කෘතීන් දුර්වලකිරීම ය. ලංකාවේ දී ඔවුන්ට අවශ්‍ය මූලික වශයෙන් සිංහල බෞද්ධ සංස්කෘතිය වැනසීම ය. එහි දී ඔවුහු දෙමළ ජනයා මෙන් ම මුස්ලිම් ජනයා ද සිංහලයන්ට විරුද්ධ ව යොදාගැනීමට උත්සාහකරති. ලංකාවේ නායකත්වයට කුමාරස්වාමි පොන්නම්බලම් පවුලෙන් පුද්ගලයන් පත්කිරීම බ්‍රිතානීන්ගේ අපේක්ෂාව විය. බ්‍රිතානීන් නයිට් (ශ්‍රීමත් - සර්) පදවියට පත්කළ පළමු ආසියාතිකයා වූයේ මුතු කුමාරස්වාමි මහතා ය. පළමු ලාංකික සිවිල් සේවකයා වූයේ පොන්නම්බලම් රාමනාදන් මහතා ය. පළමු ලාංකික නීතිපතිවරයා පොන්නම්බලම් අරුනාශලම් මහතා ය.

එහෙත් සිංහලයන් බහුතරයක් සිටින රටක දෙමළ නායකයන්ට සිංහල නායකයන් අභිබවා යෑම අපහසු විය. විශේෂයෙන් ම 1931 සර්වජන ඡන්දය ලැබීමෙන් පසුව ඒ කළ නොහැකි විය. එවිට දෙමළ නයාකයන් කෙළේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිංහල මන්ත්‍රීවරුන් බහුතරය වීම වැළැක්වීමට කටයුතුකිරීම ය. ජී ජී පොන්නම්බලම් (කලින් කියන ලද පවුලට අයත් නැත) මහතා තම කුප්‍රසිද්ධ පනහට පනහ ඉල්ලීම ඉදිරිපත් කෙළේ ඒ අරමුණෙන් ය. එහෙත් මේ නායකත්ව අපේක්ෂාවට ඉන්පසු එතරම් ආයුෂ නො වී ය. 1947 මැතිවරණයෙන් පසුව පළමු අපේක්ෂාව නැත්තට ම නැති විය. ඒ බව අවබෝධකරගත් පළමු දෙමළ නායකයා වූයේ චෙල්වනායගම් මහතා ය. සර්වජන ඡන්දයෙන් මධ්‍යයෙහි ආධිපත්‍යය ලබාගැනීම සිහිනයක් පමණක් බව ඔහු අවබෝධ කරගත්තේ ය. ඉන්පසු දෙමළ ජනයා, එනම් ඔවුන්ගේ නායකයෝ තම අපේක්ෂාව වෙනස්කළහ. මධ්‍යයෙහි නායකත්වයට පත්වීමට නොහැකි බව දුටු චෙල්වනායගම් මහතා උතුරු හා නැගෙනහිර පළාත් වෙන්කර වෙන ම රාජ්‍යයක් පිහිටුවා එහි නායකත්වයට පත්වීමට අපේක්ෂා කෙළේ ය. වෙන ම රාජ්‍යයක් පිහිටුවීම දෙමළ ජනයාගේ (නායකයන්ගේ) දෙවැනි අපේක්ෂාව විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva